# ලොව වටා පුවත් වියමන

'නීතිය යනු පාලක පන්තියේ කැමැත්තයි' යන සමාජවාදී නිර්වචනයට ශ්‍රී ලංකාවට අදාළව නව අර්ථකථනයක් ලබාදෙමින් 'නීතිය යනු පාලක කල්ලියේ කැමැත්තයි' යනුවෙන් කොළඹ විහාරමහදේවි උද්‍යාන එළිමහන් රංග පීඨයේදී පැවැති විශේෂ දේශණයකදී ජනතා විමුක්ති පෙරමුණේ මහ ලේකම් ටිළුවින් සිල්වා ඉකුත් දිනෙක කළ ප්‍රකාශයක් සටහන් කරමින් මෙවර විශ්ව වියමන ආරම්භ කරන්නේ උක්ත නිර්වචනය මෙන්ම අර්ථ කථනය ද කෙතරම් නිවැරදිදැයි කිරා මැන බැලීමට අවස්ථාවක් ද ලබා දෙමිනි. මෙවර විශ්ව වියමනේ වැඩි ඉඩක් වෙන්වන්නේ ඒ වෙනුවෙනි.

## අසාන්ජ්

ගෙවුණු වසරේ ලෝකයේ වැඩිම අවධානයට ලක්වූ පුද්ගලයන් අතර ඉදිරියෙන්ම සිටියේ ජුලියන් අසාන්ජ්ය. ඇමරිකාවේ ප්‍රකාශයට පත්කෙරෙන 'ටයිම්' සඟරාව මගින් සිදුකරන man of the year තේරීමේදී දෙසැම්බර් මස මුල් සතියටත් විටත් ඉදිරියෙන්ම සිටි පුද්ගලයා වූයේ අසාන්ජ්ය. (අසාන්ජ් ඇමරිකා පාලනයේ උදහසට ලක්වීමත් සමග ඒ තත්ත්වය වෙනස් වී එක්වරම අසාන්ධ්වගේ ස්ථානයට ෆේස් බුක් වෙබ් අඩවියේ නිර්මාතෘවරයා පාදර්හුතවිය) 2010 වසරේ නොබෙල් සාම ත්‍යාගලාභියා අසාන්ජ් විය යුතු බවට ලෝකයේ රටවල් ගණනාවක් ප්‍රකාශ කර තිබුණි. ඔහු වෙනුවෙන් දහස් ගණනක් සිවිල් වැසියන් මහමගට බැස උද්ඝෝෂණ කළහ. ඒ අත් කිසිවක් නිසා නොව මාධ්‍යවේදියෙකු ලෙස ඔහු සිය ජීවිත අවදානම පවා නොතකා සිදුකළ හෙළිදරව් කිරීම් හේතුවෙනි.

ජුලියන් අසාන්ජ් 'විකිලීක්ස්' වෙබ් අඩවියේ නිර්මාතෘවරයාය. 2006 වසරේ ඔහුගේ මූලිකත්වයෙන් ආරම්භ වූ මෙම වෙබ් අඩවිය නිර්මාමික මූලාශ්‍ර හරහා රහස්‍ය ලියකියවිලි සහ තොරතුරු ප්‍රකාශයට පත්කිරීම ආරම්භ කරගත්තකි. එහි මාධ්‍ය භාවිතය අගය කරමින් 2008 වසරේදී ඍජුබඳපසිළු සඟරාවෙන් වසරේ මාධ්‍ය සම්මානයද, 2009 වසරේදී ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයෙන් අඟගයීම් සම්මානයක්ද හිමිකර ගත්තද විකිලීක්ස් පුළුල් ජන අවධානයකට හිමිකම් කියන්නේ 2010 අප්‍රේල් මාසයේදීය. ඒ ඇමරිකා හමුදාව ඉරාකයේ සිවිල් වැසියන් ඝාතනය කරන දර්ශන ඇතුළත් වීඩියෝවක් ප්‍රසිද්ධියට පත්කිරීමත් සමගිනි. ඇමරිකාවේ කතාව සහ ක්‍රියාව අතර පවතින පරතරය ලෝකයට ප්‍රකාශ කරනු ලැබූ ඒ හෙළිදරව්වෙන් ලෝක බලවතා වන ඇමරිකාව සසලව ගියේය. එහි උණුසුම මැකී යන්නටත් පෙර ඇෆ්ගන් යුද්ධය පිළිබඳ රහස්‍ය වාර්තා විශාල ප්‍රමාණයක් ජුලි මාසයේදී විකිලීක්ස් මගින් හෙළිදරව් කෙරුණි. ඔක්තෝබර් මාසයේදී නැවතත් ඉරාක යුද්ධයේ රහස්‍ය තොරතුරු ඇතුළත් වාර්තා රාශියක් හෙළිදරව් කළ අතර නොවැම්බරයේදී අමරිකාවේ රාජ්‍ය තාන්ත්‍රික රහස් වාර්තා රාශියක්ද ප්‍රකාශයට පත්කළේය. ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයේ ජනමාධ්‍ය සැළකෙන්නේ සිව්වන ආණ්ඩුව වශයෙනි. එහෙත් මේ ආණ්ඩුවට ඇත්තේ 'බිරීමේ' බලය පමණකි.

අසාන්ජ් ක්‍රියාත්මක කළ ඒ සීමිත බලය හමුවේ සසළ වූ බිරීමේ මෙන්ම සපාකෑමේද බලය ඇති ලෝක බලවතාගේ ආණ්ඩුවත් එහි අනුනාමික ආණ්ඩුත් අසාන්ජ් දඩයම් කරන්නට ක්‍රමවේදයක් සොයන්නට විය. රහස් හෙළිවීමෙන් සිය රටට සිදුවන හානිය සෙවීම සඳහා ඇමරිකා ජනාධිපති බැරක් ඔබාමා විසින් එරට සිටින තුස්ත මර්ධන විශේෂඥයකු වන රයස් ලැයව්ස් පත්කරන ලදි. දැනට ක්‍රියාත්මක වන ඇමරිකා ඔත්තුසේවා පනත අසාන්ජ්ට දඬුවම් පැමිණවිය හැකි ආකාරයට සංශෝධනය කෙරෙන නව පනතක් ගෙන ඒමට සෙනෙට් මණ්ඩලයේ අවධානය යොමුවිය. ස්වීඩන නීතිපති දෙපාර්ථමේන්තුව විසින් අගෝස්තු මාසය වන විට අසාන්ජ්ට විරුද්ධව ලිංගික අපචාර චෝදනා ඉදිරිපත් කර එරට අධිකරණයක් මගින් ඔහු අත්අඩංගුවට ගැනීමට වරෙන්තුවක් නිකුත්කරවා ගැනීමටද ඇමරිකාව සමත්විය.

ඔස්ට්‍රේලියානු ජාතික අසාන්ජ් වැඩි කලක් ජීවත් වූ රටවල් දෙකෙන් එකක් ස්වීඩනය වන අතර අනෙක් රට එංගලන්තයයි. එහෙත් අසාන්ජ්ගේ මාධ්‍ය භාවිතය වෙනස් කිරීමට මේ කිසිවක් සමත් නොවීය. ලොව පුරා සිටින ඇමරිකා තානාපතිවරු ඇමරිකා රාජ්‍ය දෙපාර්තමේන්තුවට එවූ රහස්‍ය කේබල් පනිවිඩ ඇතුළත් වාර්තා විශාල ප්‍රමාණයක් විකිලීක්ස් මගින් නොවැම්බර් අවසානයේ ප්‍රකාශයට පත්කෙරුණේ එවන් පසුබිමකය. ඒත් සමගම අන්තර්ජාතික පොලිසිය (interpol) අසාන්ජ් අත්අඩංගුට ගැනීමට වරෙන්තුවක් නිකත් කළේය. පවත්නා කිසිම නීතියක් යටතේ විකිලීක්ස් හෙළිදරව් කිරීම් අපරාධ ගණයේ වරදකට හසුනොවන බැවින් එම වරෙන්තුවට පදනම් වී තිබුණේද ස්වීඩන් අධිකරණ වරෙන්තුවමය. තමන් සමග ලිංගිකව එක්වීමේදී උපත් පාළන කොපුවක් පාවිච්චි නොකළ බවට යම් කාන්තාවක විසින් කරන ලද බව කියන පැමිගිල්ලක් පදනම්ව පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමට Interpol මගින් වරෙන්තුවක් නිකුත් කළ ප්‍රථම අවස්ථාව මෙය විය හැකිය.

ඒ වන විටත් අසාන්ජ් සිටින ඉසව්වක් සොයා ගැනීමට නොහැකිව තිබිණ. ඔහුගේ මාධ්‍ය භාවිතාව හා බැඳුණු අවදානම හේතුවෙන් අසාන්ජ් වැඩි කලක් එක් ස්ථානයක දිවි ගෙවූයේ නැත. කෙසේ වුවද Interpol වරෙන්තුව නිකුත් කර සතියක් ඉක්ම යද්දී දෙසැම්බර් 07 දින බ්‍රිතාන්‍යයේ ලන්ඩන් නුවරදී එරට පොලිසිය අසාන්ජ් අත්අඩංගුවට ගත්තේය. අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු දින තවයක් රිමාන්ඩ් බන්ධනාගාරගත කරනු ලැබූ ඔහුට දෙසැම්බර් 16 දින ඇප ලබාදුන්නේ බ්‍රිතාන්‍ය පවුම් දෙලක්ෂ හතලිස් දහසක මුදල් ඇපයක් බැඳීමෙන් පසු දැඩි කොන්දේසි යටතේ ය. රටින් පිටවීයාමද ඔහුට තහනම් කෙරිණ.

එතැන් සිට මෙය ලියන මොහොත දක්වාත් අසාන්ජ් සිරිත්තේ බ්‍රිතාන්‍යයේ පිටිසරබඳ පෙදෙසක ඔහුගේ මිතුරෙකුගේ නිවෙසක පොලිස් ආරක්ෂාව යටතේ ය. ඉකුත් විශ්ව වියමනඳීත් සඳහන් කළාක් මෙන්ම මෙවරද කියන්නට සිදුවන්නේ අසාන්ජ්ට අත්වන ඉරණම කුමක්ද යන්න ඉදිරියේදී දැකගත හැකිවනු ඇති බවය. ඒ නීතිය සම්බන්ධයෙන් වන සමාජවාදී නිර්වචනය හා ගලපා ගත හැකි කතාව අයත්වන්නේ

සොයුරු ලසන්ත

ශ්‍රීලාල් සෙනෙවිරත්න

සමග ඉදිරිපත් කරන්නෙමි. ලසන්ත විතුමතුංග ශ්‍රී ලංකාවේ සිටි ගවේෂණාත්මක මාධ්‍යවේදීන් අතර ඉදිරියෙන්ම සිටි මාධ්‍යවේදියාය. 1994 ජූනි 19 ඔහුගේ කර්තෘත්වයෙන් ආරම්භ කරනු ලැබූ The Sunday Leader පුවත්පත මූලිකවම ක්‍රියාත්මක වූයේ අසාන්ජ්ගේ වෙබ් අඩවිය මෙන්ම රහස්‍ය සහ ගවේෂණාත්මක පුවත් අනාවරණයන් වෙනුවෙනි. ඒ හේතුවෙන්ම ආරම්භයේ සිටම ශ්‍රී ලංකාවේ ආණ්ඩු ලසන්ත සමග බද්ධ වෛරයකින් කටයුතු කළේය.

නාමමාත්‍රික ප්‍රජාතන්ත්‍රවාදයක් ක්‍රියාත්මක වන ලංකාවේ මෑත ඉතිහාසයේ ආණ්ඩු සියල්ලක්ම පාගේ පාලක පන්තියකින් නොව පාලක කල්ලියකින් සැදුම් ලැබූ ඒවා බව රටට ප්‍රකාශ කර තිබුණේ ඒ ආණ්ඩුවල සිටි අමැතිවරුන්පය. ලීඩර් පුවත්පත ආරම්භ වන විට පැවැති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංගගේ ආණ්ඩුව ක්‍රියාත්මක වන්නේ සතත් ගුණාතිලක ඇතුළු ඇයගේ පෞද්ගලික ගජමිතුරන්ගෙන් සැදුම්ලත් කුස්සි කැබිනට්ටුවකින් බව එවක කැබිනට් අමැතිවරුන් පවසා තිබිණ. අනතුරුව බලයට පත් මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව ක්‍රියාත්මක වන්නේ ඔහුගේ සහෝදරයන් වන බැසිල් රාජපක්ෂ, ගෝධාභය රාජපක්ෂ ප්‍රමුඛ සහෝදර සමාගමක් මගින් බව ප්‍රකාශ කරනු ලැබුයේද ඒ ආණ්ඩුවේ මුල් අවධියේ ප්‍රහල කැබිනට් ඇමැති ධුරයක් දරන මංගල සමරවීර විසිනි.

මේ සියලු ආණ්ඩුවලට ලසන්තගේ මාධ්‍ය භාවිතය හිසරදයක් වී තිබුණේ අද අසාන්ජ්ගේ මාධ්‍ය භාවිතය ඇමරිකාවට හිසරදයක් වී ඇති පරිදිදෙන්මය. අද අසාන්ජ්ට මෙන්ම එදා ලසන්තට එරෙහිවත් ඉදරිපත් කරන්නට අපරාධ චෝදනාවක් ඔහුගේ මාධ්‍ය භාවිතය තුළින් මතු කරගන්නට නොහැකිවිය. එබැවින් ලංකාවේ ආණ්ඩු කළේ ලසන්තටත්, ඔහුගේ පුවත්පතටත් එරෙහිව අදිසි ප්‍රහාර දියත් කිරීමය. එහෙත් අසාන්ජ් මෙන්ම ලසන්ත ද මේ ප්‍රහාර හමුවේ පසුබා ගියේ නැත.

2005 බලයට පත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව සිව්වන ඊළාම් යුද්ධයට ප්‍රවේශවීමත් සමග දූෂිත යුද අවි ගනුදෙනු ආදියට සම්බන්ධ ගවේෂණාත්මක පුවත් අනාවරණයට ලීඩර් පුවත්පත ප්‍රමුඛත්වය දුන්නේය. ප්‍රථිපලය ලසන්ත රාජපක්ෂ ආණ්ඩුවේ උදහසට හා මරණ තර්ජනයට ලක්වීමය. එයින්ද ලසන්ත පසුබෑවේ නැත. දෙවනුව රාජපක්ෂ ආණ්ඩුවේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙන්ම ජනාධිපතිවරයාගේ සහෝදරයාද වන ගෝධාභය රාජපක්ෂ ලීඩර් පුවත්පත සිය කීර්ති නාමයට හානි වන අසත්‍ය පුවතක් පළ කර ඇති බවට චෝදනා කොට ගල්කිස්ස අධිකරණය මගින් එම

පුවත්පතට විරුද්ධව වාරණ නියෝගයක් ලබාගත්තේය. තමන් පළ කළ පුවතේ සත්‍යතාවය අධිකරණය හමුවේ ඔප්පු කිරීමේ වගකීම ලසන්තට පැවරුණි. ඒ සඳහා ඔහුට ගල්කිස්ස අධිකරණය හමුවේ පෙනී සිටින්නට නියමිතව තිබුණේ 2008 ජනවාරි 10 දිනය. ඔහු ඒ සඳහා සූදානම්ව සිටියේය. එහෙත් ජනවාරි 08 පෙරවරුවේ සිය කාර්යාලය වෙත පැමිනෙමින් සිටියදී කුලී ඝාතක කණ්ඩායමක් ලසන්තව මග මරාදැමුවේ අධිකරණය වෙත යාමට ඉඩ නොතබමිනි. යතුරුපැදිවලින් ලසන්තගේ මෝටර් රථය ඉහුබැඳ පැමිණි ඝාතකයන් රත්මලාන ගුවන් හමුදා කඳවුරු අධි ආරක්ෂක කළාපය සමීපයේදී ඔහුට ප්‍රහාරය එල්ල කර පළාගියේද අධි ආරක්ෂක කළාපය දෙසටය.

මේ වන විට ඝාතනයට වසර දෙකක් ගතවී ඇතත් ඝාතකයන් අත්අඩංගුවට ගැනීමට ශ්‍රී ලංකා පොලිසියට හැකිවී නැත. එය නොහැකියාවක්ද නොකරනැරීමක්ද යන්න කිව නොහැක්කේ දේශපාලන සම්බන්ධතා නොමැතිව රට තුළ සිදුවන කොතරම් බරපතල අපරාධයක් වුවද හෙළිදරව් කරගැනීමට ශ්‍රී ලංකා පොලිසිය සමත් බැවිනි.

අසාන්ජ් අත්අඩංගුවට ගැනීම හෝ විකිලීක්ස් වෙබ් අඩවියට මුදල් ලැබෙන මාර්ග අවුරා දැමීම මගින් විකිලීක්ස් ක්‍රියාකාරිත්වය වෙනස් කරන්නට ලෝක බලවතාට පවා නොහැකි විය. ළඟදීම රහස් හෙළිකරන තවත් වෙබ් අඩවියක් අරඹන්නට විකිලීක්ස් කණ්ඩායම සූදානම්ව සිටී. එහෙත් ලසන්ත ඝාතනයෙන් පසු ලීඩර් පුවත්පතේ ක්‍රියාකාරිත්වය වෙනස් කරවා ගැනීමට ශ්‍රී ලංකාවේ බලවතාට හැකියාව ලැබී තිබේ. ලසන්තගෙන් පසු එම පුවත්පතේ කර්තෘ ධුරයට පත් ෆෙඩ්රිනා ජෑන්ස් මේ වන විට ආරක්ෂක ලේකම් ගෝධාභය රාජපක්ෂ වෙනුවෙන් අධිකරණය හමුවේ සාක්ෂි දෙන්නීය.

තමන්ට රටේ ප්‍රධාන පුරවැසියා වන මහින්ද රාජපක්ෂගෙන් මරණ තර්ජණ එල්ල වී ඇතැයි ලසන්ත පොලිස්පතිවරයාටම පැමිණිලි කර තිබුණද ඔහුට ආරක්ෂාව දෙන්නට පොලිස්පතිවරයා කටයුතු කර නොතිබුණ බැවින් ඔහු සිය මෝටර් රථයෙන් ගමන් බිමන් ගියේ අනාරක්ෂිතව තනිවමය. එහෙත් ලසන්ත ගරෙඩියකුට සමාන කරමින් ජනමාධ්‍ය හමුවේ ප්‍රසිද්ධියේ කතාකළ ගෝධාභය වෙනුවෙන් සාක්ෂි දෙන්නට අද ෆෙඩ්රිනා අධිකරණයට යන්නේ පොලිසියේ විශේෂ ආරක්ෂාව සහිතවය. දැන් ලීඩර්ගෙන් රාජපක්ෂ පාලනයට හෝ රාජපක්ෂ පාලනයෙන් ලීඩර්ට තර්ජණයක් නැත.

2010 වසර තුළ හොන්දුරාස්හිදී සිදුවූ මාධ්‍යවේදීන් දඩයම්වල දසවැන්න වාර්තා වූයේ දෙසැම්බර් මස 28 දිනය. නාදුනන තුවක්කුකරුවන් පිරිසක් විසින් වෙඩි තබා ඝාතනය කරනු ලැබුවේ හෙන්රි සුවාකෝ නමැති ගුවන්විදුලි මාධ්‍යවේදියෙකි.

## සිසිලට ගිනි

ස්කැන්ඩියානු රටකට එල්ල වූ ප්‍රථම මරගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය වාර්තා වූයේ ද දෙසැම්බර් මාසයේදීය. ස්වීඩනයේ ස්ටොක්හෝල්මිස් අගනුවරට බෝම්බ අටවන ලද මෝටර් රථයකින් පැමිණ ප්‍රහාරය එල්ල කරනු ලැබුවේ දෙසැම්බර් 11 ය. ප්‍රහාරයෙන් ප්‍රහාරකයා ජීවිතක්ෂයට පත්වුවද වෙනත් කිසිවෙකු ජීවිතක්ෂයට පත් නොවුණේ සැළසුම නිසි ලෙස ක්‍රියාත්මක නොවූයෙන් බව වාර්තා විය. ඉස්ලාමීය සටන්කාමී නායකයකුවන ටයිමෝර් අබුදුල් වහාබ් මෙහි සැළසුම්කරු බව පසුව සොයාගෙන තිබුණි.

නැගෙනහිර මධ්‍යධරණී සහ මැදපෙරදිග රටවල් රැසක් දෙසැම්බරයේ ඇතිවූ අසාමාන්‍ය කාල ගුන විපර්යාස හේතුවෙන් බලවත් පීඩාවන්ට මුහුණ පෑහ. අධික වර්ෂාව, සුළි සුළං, වැලි කුණාටු, හිම කුණාටු, ගංවතුර ආදී මෙකී ස්වාභාවික ආපදාවන් බොහොමයකට හේතුව ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම බව පරිසරවේදීන්ගේ අදහසවිය. දෙසැම්බර් 12 දින ලෙබනනය සහ ඊශ්‍රායලය අවට මුහුදේ අඩි 10ක් පමණ උසට මුහුදු රළ නැගීම හේතුවෙන් දෙරට ධීවර සහ වෙළඳ වරායන් රාශියක් වසා දමන්නට සිදුවිය. ලෙබනනය හරහා දුරුණු හිම කුණාටුවක් හමා ගියේද ඒ අතරය. ජල මට්ටම ඉහළයාම හේතුවෙන් මධ්‍යධරණී සහ රතු මුහුදු යාකෙරෙන සුවිස් ඇළ ද දින ගණනාවක් තිස්සේ ප්‍රවාහන කටයුතු සඳහා විවෘත නොකෙරිණ. ඊජිප්තුවේ කයිරෝ ගුවන්තොටුපොල ඇතුළුව මැදපෙරදිග ගුවන් තොටුපොල ගණනාවක්ම දින ගණනක් වසා දමන්නට සිදුවිය.

## සුපර් ස්ටාර් ?

ඉන්දියාව ලෝක අවධානයට ලක්වන ප්‍රමුඛ හේතුව බොලිවුඩ් සිනමාවය. එහෙත් පසුගිය මාස කීපය තුළ ඉන්දියාව ලෝක අවධානයට ලක්වන්නට වූයේ වෙළඳ ගිවිසුම් නිසාය. මේ ගිවිසුම් එසේ මෙසේ ඒවා නොව ඩොලර් බිලියන ගණනින් වන ඒවාය. ඒවා අස්සන් කරන්නට ලෝකයේ බලවත් රටවල රාජ්‍ය නායකයන් ඉන්දියාවට පැමිණියේද එසේ මෙසේ ධූත පිරිස් සමග නොව සිය ගනනින් වන ධූත පිරිස් සමගිනි. මෑත කාලයේ මේ විෂය සම්බන්ධයෙන් නම් දැරූ රාජ්‍ය නායකයා වූයේ ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂය. ඔහු විදේශ සංචාර ගියේ ඔබාඳ හොල්මන් වන ආකාරයෙන් සිය ගණනින් පරිවාර සේනාවක් සමගය. මෙය ඉවසා සිටින්නට බැරි තිසාදෝ ඔබාමා ඉකුත් නොවැම්බරයේ ඉන්දියාවේ ගිල සංචාරය සඳහා පැමිණියේ භාර සියක පමණ ධූත පිරිසක් සමගිනි.

පැමිණ ඩොලර් බිලියන 10 ක වෙළඳ ගිවිසුමකට අස්සන් කළේය.

දෙසැම්බර් 04 දා සිව්දින ගිල සංචාරයක් සඳහා ඉන්දියාවට පැමිණි ප්‍රංශ ජනාධිපති නිකලස් සර්කෝසි විසින් ඩොලර් බිලියන 22 මහා පරිමාණ ව්‍යාපෘතිවලට අදාළ ගිවිසුමකට අස්සන් කරනු ලැබුවේය.

කලාපයේ බලවතා වන චීනයේ අගමැති වෙන් ජියාබෝ දෙසැම්බර් 15 දා ඉන්දියාවට ගොඩබැස්සේ ඔබාමා මෙන්ම හාරසියක ධූත පිරිසක් සමගිනි. දෙදින ගිල සංචාරයක යෙදුන චීන අගමැතිවරයා දෙරට අතර ඇමරිකා ඩොලර් බිලියන 16ක් වටිනා වෙළඳ ගිවිසුමක් අස්සන් කළේය. රුසියානු ජනාධිපති දිමිත්‍රි මෙඩ්වෙදේව් ඉන්දියාවට පැමිණියේ දෙසැම්බර් 21 දිනය. ඔහු කැටුව ආ ධූත පිරිස 100 කි. අස්සන් කරන ලද වෙළඳ ගිවිසුම්වල වටිනාකම ඩොලර් බිලියන 20 කි. වසර අවසාන වන විට ඉන්දියාව ලෝකයේ සුපිරි තරුව බවට පත්ව තිබුණේ ඒ අයුරිනි.